කොවිඩ් 19 සති පාසල

සබරගමුව

විෂය- පුරවැසි අධ්‍යාපනය ශ්‍රේණිය - 09 ශ්‍රේණිය වාරය-III
සතිය - 01 සතිය

පාඩම-ගැටුම් නිරාකරණය

<u>ක්‍රියාකාරකම</u>-9.5.1 ගැටුම් පිළිබඳ විශ්ලේෂණය කරයි.

<u>හැඳින්වීම</u>- සමාජය පුද්ගලයන් සමූහයකින් සමන්විත වේ.ඔවුන් විවිධාකාර නිසා ඔවුන් දරණ අදහස් මතවාද ,විශ්වාස,උගත් නූගත්කම්,දුප්පත්,පොහොසත්කම් අනුව වෙනස්කම් ඇතිවේ.මේ නිසා ගැටුම් ඇතිවිය හැකිය.ඒ නිසා හිත් රිදවීම්,දුකට පත්වීම්,ආතතිය,ප්‍රචණ්ඩත්වය හෝ විනාශකාරී ක්‍රියාවලට පවා යොමුවිය හැකිය.මෙය <u>තමා තුළ මෙන් ම පුද්ගලයන් අතරද, පවුල් අතරද, ප්‍රාදේශීය වශයෙන් මෙන් ම රටවල් අතරද කලාපීය හෝ ජාත්‍යන්තර වශයෙන් ද ගැටුම් ඇතිවිය හැකිය</u>.මෙසේ ඇතිවන ගැටුම් නිරාකරණය කර ගැනීම පිළිබඳව මෙම පාඩම තුළින් හඳුනා ගත හැකිය.

ඔබ මීට පෙරද ගැටුම් පිළිබඳව හදාරා ඇති බැවින් මෙහි දී එය තව දුරටත් හඳුනාගෙන තිරසාර සාමයක් ගොඩනගාගත හැකි ආකාරය හඳුනාගත හැකිය.

<u>ගුණාත්මක යෙදවුම්</u>- පෙළපොත/පුවත්පත් වල ගැටුම් ඇති සොයා ගන්න.

<u>ක්‍රියාකාරකම සඳහා සිසුන්ට උපදෙස්-</u>

පියවර 1- පෙළපොතේ පිටු අංක 111-114 දක්වා අවබෝධයෙන් කියවන්න.

පියවර 2-_කළින් අවස්ථාවල මෙන්ම,අභ්‍යාස පොත භාවිත කර ප්‍රශ්නය ලියා පිළිතුරු සපයන්න.

<u>ප්‍රශ්නාවලිය</u>.

1. ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂයේ සඳහන් ගැටුම් නිර්වචනය උපුටා දක්වා,ඒ ආකාරයේ ගැටුම් පිළිබඳ පොදු නිර්වචනයක් ගොඩ නගන්න.
2. ගැටුම් ඇති වීමට බලපාන හේතු 05ක් ලියන්න.
3. ගැටුම් ඇතිවිය හැකි පාර්ශව 06ක් ලියන්න.
4. විවිධ ගැටුම්,වර්ග කළහැකි ආකාර දක්වා උදාහරණය බැගින් සපයන්න.
5. ඔබ පුවත්පතින් සොයාගත් ගැටුම් අවස්ථාවක් ලියන්න.(නැතහොත් එය කපා පොතේ අලවාගන්න.)

පසු වැඩ
පෙළපොතේ සඳහන් ක්‍රියාකාරකම 5.1 කරන්න.
පාසල ආරම්භ වූ විගස ඔබගේ පුරවැසි අධ්‍යාපන විෂය භාර ගුරු භවතාට පෙන් වීමට සලස්වන්න. (මෙය තෙවන වාරයට නියමිත පළමු සතියට අදාළ පැවරුම වේ.)

සැකසීම-ර/නිවි/පලාවෙල ශ්‍රී රත්නාකර ම.වි

එම්.ඒ.පත්මලතා මිය

සැකසුම- .උදාර අරවින්ද-නිවිතිගල කලාපය-.(ර/නිවි/කලවාන ජාතික පාසල)